**<u>අවුරුදු කාල සීමාව සඳහා සුඛෝපභෝගී සේවාවේ අධිවේගී මාර්ගයේ බස් රථ ධාවනය කරනු ලබන ජා.ග.කො.ස. අවසරපත්‍ර හිමියන් සහ අතිරේකව යොදවනු ලබන පළාත් ප්‍රවාහන අධිකාරීවල සුඛෝපභෝගී බස් රථ හිමියන් සඳහා කෙරෙන නිවේදනයයි.</u>**

2026 -සිංහල හා හින්දු අලුත් අවුරුදු කාල සීමාවේදී විශේෂ බස් රථ සංවිධානය කිරීමේ කටයුතු 2026.04.08 දින සිට 2026.04.20 දින දක්වා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කර ඇත.

අධිවේගී මාර්ගයේ හා සුඛෝපභෝගී බස් රථ සඳහා වැඩි මගී ඉල්ලුමක් පැවතිය හැකි බවට පුරෝකතනය කර ඇත. ඒ අනුව වැඩිවන මගී ඉල්ලුම සපුරාලීම සඳහා වැඩිපුර ගමන්වාර සංඛ්‍යාවක් බස් රථ ධාවනය කරලීමට කටයුතු යොදා ඇත.

එම නිසා බස් රථ ධාවකයින් දිරිගැන්වීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පෙර අවුරුදු කාල සීමාවේ අප්‍රේල් 09,10 ,11සහ 12 යන දින වලදී හා පසු අවුරුදු කාල සීමාවේ අප්‍රේල් 18,19 සහ 20 දිනවල මගී අවශ්‍යතාවය සපුරාලීම සඳහා එක් අන්තයකින් හිස්ව පැමිණෙන අධිවේගී මාර්ගවල ධාවනයට යොමු කර ඇති බස් රථවලට ආසන ධාරිතාවයෙන් 25% සඳහා බස් රථ ගාස්තුව සහ අධිවේගී මාර්ගයේ පිවිසුම් ගාස්තුව පහත කොන්දේසි වලට යටත්ව ප්‍රතිපූර්ණය කිරීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කර ඇත.

- **ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් අවසරපත්‍ර නිකුත් කර ඇති බස් රථවල ජී.පී.එස්. උපකරණ අනිවාර්යෙන් මෙම කාල සීමාව තුල ක්‍රියාත්මක තත්වයේ පැවතිය යුතුය.**
- **බස් රථය තමන්ට අදාල පර්යන්තයෙන් පිටත්වීමේදී අනිවාර්යෙන් ලොග්/පිවිසුම් පත්‍රය බලයලත් නිලධාරියාගෙන් අත්සන් යොදා සහතික කරගත යුතුය.**
- **බස් රථ නැවතුම්පලවල ප්‍රධානීන්/ වේලාසටහන්කරුවන් මගින් මෙම ප්‍රතිපූර්ණයට අදාලව ලබාදී ඇති ආකෘතිපත්‍රය සම්පූර්ණ කරවාගෙන සහතික කරගත යුතුය**
- **අධිවේගී මාර්ග පිවිසුම් ගාස්තු සඳහා අදාල බිල්පත ඉදිරිපත් කල යුතු වේ.**
- **පසු අවුරුදු කාල සීමාව තුල පිටපළාත් සිට කොළඹ බැස්ටියන් මාවත, කඩවත, කඩුවෙල හා මාකුඹුර දක්වා ධාවනය කරන බස් රථ සිය ධාවනය සම්පූර්න කිරීම පිළිබඳව බස් රථ නැවතුමට අනුයුක්ත කර ඇති නිලධාරීන් මගින් අත්සන් යොදා සහතික කරගත යුතුය.**

ඉහත කොන්දේසි සම්පූර්ණ කරනු ලබන අධිවේගී මාර්ග බස් රථ ධාවකයින් සඳහා, 2026.04.27 දිනෙන් පසු ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් අදාල මුදල් ප්‍රතිපූර්ණය කරනු ලබන බවට කාරුණිකව දන්වා සිටිමි.

**සභාපති**
**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**
**ක්ෂණික ඇමතුම්-1955**